**ශීර්ෂය 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 19 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම, සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 200,662.97 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 199,137.93 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,525.04ක් හෙවත් සියයට 0.76 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 200,622.97 | 199,105.43 | 1,517.54 | 0.75 |
| මූලධන | 40.00 | 32.50 | 7.50 | 18.75 |
| **එකතුව** | **200,662.97** | **199,137.93** | **1,525.04** | **0.76** |

**2.2** **ආදායම් ගිණුම්**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්**

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේත 02 ක් සඳහා එකතුව රු.මිලියන 18,500.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 18,046.17 ක ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් රු.මිලියන 453.83 ක් හෙවත් සියයට 2.45 ක් අඩුවෙන් ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ආදායම් සංකේතය** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඌනතාවය ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **ඌනතාවය** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.04.01.00 | 12,000.00 | 11,956.53 | 43.47 | 0.36 |
| 20.04.02.00 | 6,500.00 | 6,089.64 | 410.36 | 6.31 |
| **එකතුව** | **18,500.00** | **18,046.17** | **453.83** | **2.45** |

**2.3** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 25301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 40.00 | 39.99 | 25.00 | 25.19 | 150.00 | 115.49 |

**2.4** **අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0062/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.66,986 ක් විය.

**2.5** **පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 03 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 13.75 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0016/0103/000 | 1.29 |
| 6000/0000/00/0013/0113/000 | 12.05 |
| 6000/0000/00/0001/0114/000 | 0.41 |
| **එකතුව** | **13.75** |

### 2.6 විගණන නිරීක්ෂණය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| (ii) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (iii) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |
| (iv) | ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත | මුදල් රෙගුලාසි 1647 (ඇ) | පවත්වා නොතිබුණි. |
| (v) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලින කර නොතිබුණි. |
| (vi) | බාලවයස්කාර ලේඛනය | 2011 නොවැම්බර් 04 දිනැති අංක 08/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

**3.2 විගණන සාක්ෂි නොවීම**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී කොලොන්නාව, දිවුලපිටිය හා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිදු කළ විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ නියැදි විගණන පරීක්ෂාවලදී විශ්‍රාමිකයන් 182 දෙදෙනෙකු වෙත එකතුව රු.මිලියන 68.77 ක් විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි. එම ගෙවීම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා අදාළ විශ්‍රාමිකයින්ගේ ලිපිගොනු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික ණය ශේෂය රු.මිලියන 30,612.71 ක් වී තිබුණි. විශ්‍රාමිකයාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, විශ්‍රාම වැටුප් අංකය යනාදි විස්තර ඇතුළත් කර කේවල ශේෂ ලැයිස්තුවක් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණි. මේ නිසා ගෙවිය යුතු ණය ශේෂයේ නිවැරදිතාවය විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය සමඟ සසඳා පරීක්ෂා කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2014 නොවැම්බර් 21 දිනැති අංක 15/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින්ම වර්ෂයකට වඩා වැඩි කාලයක් විදේශගත වී සිටින විශ්‍රාමිකයන්ගේ ලිපිගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විදේශ විශ්‍රාම වැටුප් අංශයට යැවීම සිදුකළ යුතුව තිබුණි. කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එසේ යවන ලද ලිපිගොනු පිළිබඳ නිවැරදි තොරතුරු පවත්වා නොතිබුණි. එමෙන්ම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විදේශ විශ්‍රාම වැටුප් අංශය විසින්ද එසේ ලැබෙන ලිපිගොනු පිළිබඳ තොරතුරු විධිමත්ව ලේඛනගත කර පවත්වා නොතිබුණි.

**3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

-----------------------------------

2015 වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව සඳහා 2017 ඔක්තෝබර් මාසය අවසන් වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**3.4 විසර්ජන ගිණුම**

-------------------

දෙපාර්තමේන්තුවට අදාළව විගණනයට ඉදිරිපත් කළ විසර්ජන ගිණුම් පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ හේතුවෙන් එම ගිණුමේ නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

**(අ) ගිණුම් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම**

------------------------------------------

භාෂාත්‍රයෙන් ඉදිරිපත් කර තිබූ විසර්ජන ගිණුම් පිටපත් අතර අවස්ථා 15 කදී සංඛ්‍යාත්මක වෙනස්කම් පැවතුණි.

**(ආ) අයවැය විචලනය**

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 18 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 ක සිට සියයට 49 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. ඒ අනුව

විසර්ජන ගිණුමේ ප්‍රතිපාදන ඉතිරිවීම් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සඳහන් කර තිබුණු හේතු විගණනයේදී පිළිගැනීමට නොහැකි විය.

(ii) අනතුරට ලක් වූ හා මිය ගිය ආරක්ෂක රණවිරුවන් සඳහා වැටුප් හා දීමනා ගෙවීමට 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 253-1-2-1501(1) වැය විෂය යටතේ රු.මිලියන 23,400.00 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම නිසා වෙනත් වැය විෂයයන්ගෙන් රු.මිලියන 3,372.43 ක ප්‍රතිපාදන වීරමොං පරිපාටිය අනුගමනය කර මාරු කර ගෙන තිබුණි. අවශ්‍ය ප්‍රතිපාදනය නිවැරදිව ඇස්තමේන්තු නොකර අමතර ප්‍රතිපාදන ලබා ගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට එසේ මාරු කර ගෙන තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 93.39 ක් ඉතිරි කර තිබුණි.

**(ඇ) වියදම් විධිමත් පරිදි ගිණුම්ගත නොකිරීම**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) වියදම් පාලනය දුර්වලවීම**

--------------------------

253-01-02-1-1502 වැය විෂය යටතේ රාජ්‍ය නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික හා දුම්රිය බලපත්‍ර දීමනා වශයෙන් උප වැය විෂයයන් 03 කට 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසා තිබුණි. නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එම උප වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයන් අනුව උපයෝජනයන් නොකර ප්‍රධාන වැය විෂය යටතේ වියදම් වාර්තා වන ආකාරයට වැය ලෙජරය පවත්වා තිබුණි. මේ නිසා දෙපාර්තමේන්තුව විසින් අපේක්ෂා කළ වියදම් පාලනය සිදු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ii) විශ්‍රාම පාරිතෝෂික වෙනුවෙන් විශ්‍රාමිකයින් විසින් රාජ්‍ය බැංකු වෙත ගෙවිය යුතු ණය වාරික විසර්ජන ගිණුමේ සඳහන් කර නොතිබීම**

-------------------------------------------------------------------------

2014 අප්‍රේල් 09 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා විශ්‍රාමිකයින් 63,626 දෙනෙකුට විශ්‍රාම පාරිතෝෂික වශයෙන් රු.මිලියන 33,047.56 ක් ගෙවිය යුතුව තිබුණි. එම විශ්‍රාම පාරිතෝෂික දෙපාර්තමේන්තුව විසින් නොගෙවා රාජ්‍ය බැංකු මගින් ලබා ගත් චක්‍රීය ණය මුදලක් මීගින් විශ්‍රාමිකයන්ට ගෙවා තිබුණි. එම වටිනාකම වර්ෂ 18 කින් බැංකුව වෙත ගෙවීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා බැංකුව අතර අවබෝධතා ගිවිසුම්වලට එළඹ තිබුණි. එසේම එම ණය මුදල් වෙනුවෙන් වූ පොලිය දෙපාර්තමේන්තුව විසින් මාසිකව බැංකුව වෙත ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2016 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 30,612.70 ක් බැංකුව වෙත ගෙවිය යුතුව තිබුණි.

**(iii) බැංකු විසින් විශ්‍රාමිකයන්ට ගෙවා තිබුණු විශ්‍රාම පාරිතෝෂිකය වෙනුවෙන් පොලී ගෙවීම**

-------------------------------------------------------------------------

විශ්‍රාම පාරිතෝෂික ගෙවීම බැංකු විසින් සිදු කිරීම නිසා බැංකු වෙත ගෙවිය යුතු ණය පොලිය දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. එම බැංකු ණය පහසුකම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2,404.69 ක්ද, 2014 අප්‍රේල් 09 දින සිට 2015 වර්ෂය අවසානය දක්වා වූ කාලය සඳහා රු.මිලියන 2,209.06 ක් ද, වශයෙන් ණය පොලී ගෙවා තිබුණි. එසේ ගෙවා තිබුණු පොලිය 1601 වැය විෂය යටතේ ගිණුම්ගත

කර නොතිබුණු අතර එය සදොස් ලෙස 253-01-02-1-1502(11) විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් පිළිබඳ වැය විෂයය යටතේ ගිණුම්ගත කර තිබුණි . ඒ අනුව විශ්‍රාම පාරිතෝෂික වියදම වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු අතර පොලිය වශයෙන් ගිණුම්ගත කළ යුතු වියදම් ගිණුම් ගත වී නොතිබුණි. මේ නිසා ශ්‍රී ලංකා ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල ණය පොලී වියදම සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2,404.69 කින්ද, ඊට පෙර වර්ෂයන් වෙනුවෙන් රු.මිලියන 2,209.06 කින්ද අඩුවෙන් දක්වා තිබුණි.

**(iv) විශ්‍රාමිකයා විසින් ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික ණය වාරික අයකර ගැනීමට නොහැකිවීම**

---

විශ්‍රාමිකයාට දෙනු ලබන පාරිතෝෂික ණය මුදලින් සියයට 60 ක පමණ මුදල අයවීමට පෙර විශ්‍රාමිකයා මියගිය විට අය කර ගැනීම නොහැකි වන වාරික දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණු බැවින්, එම වාරික ගෙවීම පිළිබඳ තොරතුරු හඳුනාගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණි.

**(ඇ) විශ්‍රාම පාරිතෝෂිකයෙන් සිදුකරන අවකරණ ගිණුම්ගත නොකිරීම.**

---

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම පාරිතෝෂිකයෙන් සිදු කරන අවකරණයන් නිවැරදිව ගිණුම්ගත කර ඇති බව තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) නියැදි විගණන පරීක්ෂාවන්ට අනුව, විශ්‍රාමගිය හා මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමට අදාළ හිඟහිටි ණය ශේෂ පියවීම සඳහා එම නිලධාරීන්ගේ විශ්‍රාම හා මරණ පාරිතෝෂිකවලින් අවකරණය කර අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත රු.මිලියන 94.99 ක ප්‍රතිපාදන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට එම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් පිළියෙල කර තිබුණු රජයේ නිලධාරීන්ට අත්තිකාරම ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශන අනුව එම හිඟ හිටි ණය ශේෂ පියවා නොතිබුණි.

(ii) මධ්‍යම රජයේ අමාත්‍යාංශ 27 කට හා දෙපාර්තමේන්තු 64 කට අදාළව, භාණ්ඩාගාරයෙන් ලබාගත් තොරතුරු අනුව, 2016 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාම ගිය හා මියගිය විශ්‍රාමිකයින්ගේ පාරිතෝෂික වලින් අඩුකර ගත් රු.මිලියන 138.02 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(iii) 2016 වර්ෂයේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් මධ්‍යම රජයට අයත් නිලධාරීන් 4318 දෙනෙකුගෙන් රජයට අයවිය යුතු මුදල් පියවීම සඳහා එම නිලධාරීන්ගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් රු.මිලියන 385.05 ක් අඩුකර අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ප්‍රතිපාදන ලබා දී තිබුණි. අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 19.79 ක් උපයෝජනය නොකිරීම නිසා එම මුදල පාරිතෝෂික වියදමක් ලෙස ගිණුම්ගත වී නොතිබුණි.

(iv) පළාත් සභා හා පළාත් සභා ආයතනවල සේවයේ නියුක්තව සිට විශ්‍රාම ගිය හා මිය ගිය නිලධාරීන්ගෙන් නියැදියක් පරීක්ෂා කිරීමේදී 2016 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 50.20 ක් එම නිලධාරීන්ගේ විශ්‍රාම හා මරණ පාර්තෝෂිකවලින් අවකරණය කර තිබුණත්, එදින වන විටත් එම අවකරණ නිරවුල් කර නොතිබුණි.

**(ඉ) වියදම හා අධිහාර කිරීම්වල නිවැරදිභාවය තහවුරු කර නොගැනීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් විශ්‍රාම වැටුප් ගෙවීම් හා ඊට අදාළ වන අධිහාර කිරීම් මාසික ගිණුම් සාරාංශ මගින් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර තිබුණි. භාණ්ඩාගාරය විසින් එම වියදම් හා අධිහාර කිරීම් දෙපාර්තමේන්තුවේ ශීර්ෂය යටතේ ගිණුම්ගත කර තිබුණි. එම ගිණුම්ගත කිරීම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් එම වියදමට හා අධිහාර කිරීම්වලට අදාළ හර හා බැර නිවේදන ගෙන්වා ගෙන සැසඳීම් සිදු කර නොතිබුණි.

(ii) විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2016 ජනවාරි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා කාලයට අදාළව විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම් හා අධිහාර කිරීම් හර හා බැර නිවේදන මගින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට එවා තිබුණි. අමාත්‍යාංශයේ පොත් හා භාණ්ඩාගාර පොත් අතර වූ වෙනස හඳුනාගැනීම සඳහා එම හර හා බැර නිවේදන සැසඳීම දෙපාර්තමේන්තුව විසින් සිදු කර නොතිබුණි. 2016 ජූලි, අගෝස්තු හා සැප්තැම්බර් යන මාසයන්හි භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව වූ වියදම් හා දෙපාර්තමේන්තුවේ පොත් අනුව වූ වියදම අතර රු.මිලියන 2.40 ක වෙනසක් පැවැතුණි.

(iii) විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් බැර නිවේදන යටතේ වූ වාර්තා කර තිබුණු තොරතුරු අනුව විශ්‍රාමිකයින්ගේ විස්තර හා ඊට අදාළ කාරණය පිළිබඳව පරීක්ෂා කර නොතිබුණි. මේ නිසා විශ්‍රාමිකයන් මියගිය පසු ගෙවා තිබුණු විශ්‍රාම වැටුප් ආපසු අයකර ගැනීමට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.

**(ඊ) විමධ්‍යගතව පවත්වා ගෙන ගිය විශ්‍රාම වැටුප් දත්ත සමුදායන් (Database) සියල්ල ඒකාබද්ධ කර මධ්‍යගත දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් විශ්‍රාම වැටුප් ගෙවීමේදී සිදුවී තිබුණු වැරදි ගෙවීම් හා අක්‍රමිකතාවයන් වලකා ගැනීම අරමුණු කරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් විමධ්‍යගතව පවත්වාගෙන ගිය විශ්‍රාම වැටුප් දත්ත සමුදායන් (Database) සියල්ල ඒකාබද්ධ කර මධ්‍යගත දත්ත පද්ධතියක් නිර්මාණය කර තිබුණි. ඒ අනුව 2015 ජනවාරි මාසයේ සිට මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකිරීම ආරම්භ කර තිබුණි. ඉහත සඳහන් පරිදි සකස් කරන ලද මධ්‍යගත දත්ත පද්ධතිය, විශ්‍රාමික සංගණනයක් තුළින් සනාථ කර ගෙන නොතිබුණි. මේ නිසා පෙර දත්ත පද්ධතීන්හි තිබූ වංචා සහගත දුර්නිරූපණයන්, විශ්‍රාමික තොරතුරුවල ඌනතාවයන් නව දත්ත පද්ධතියේද නොමැති බව සනාථ කර ගෙන නොතිබුණි.

(ii) ඉහත සඳහන් නව මධ්‍යගත දත්ත පද්ධතිය මගින් විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රතිනිර්මාණය කිරීමේදී සිදු විය හැකි වැරදි හා වංචා වළක්වා ගැනීම සඳහා මධ්‍යගත දත්ත පද්ධතිය තුළ හා පුද්ගල මෙහෙයුම් ක්‍රියාවලිය තුළ ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) පාලන ගිණුම් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රථම විශ්‍රාම වැටුප් ගෙවීම හා බැංකු ණය යටතේ පාරිතෝෂික ගෙවීම්වලට අදාළව පාලන ගිණුමක් පවත්වා නොතිබුණි.

(ii) මාසික විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළව පිළියෙල කරනු ලබන මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් සැසඳීම් වාර්තාව මාසික විශ්‍රාම වැටුප් ගෙවීමට පෙර පිළියෙල කර එහි නිවැරදිතාවය තහවුරු කරගෙන ඒ අනුව මාසික විශ්‍රාම වැටුප් ගෙවීම්හි නිවැරදිතාවය තහවුරු කර නොතිබුණි.

## 3.5 පොදු තැන්පත් ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 571(1) ප්‍රකාරව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම කල් ඉකුත් වූ තැන්පතු පිළිබඳව ලැයිස්තු පිළියෙල කර නොතිබුණි.

(ආ) විශ්‍රාමිකයින් 03 දෙනෙකුට හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා නිකුත් කරන ලද රු.37,267 ක චෙක්පත් නොගෙවා ආපසු ලැබී තිබුණි. එම මුදල විශ්‍රාමිකයන් වෙත කඩිනමින් ගෙවීමට කටයුතු නොකර 2016 මැයි 05 දින සිට 2017 ඔක්තෝබර් මාසය දක්වා වර්ෂයකට වැඩි කාලයක් තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 3.6 අග්‍රිම ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් පාලන සේවා වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල්හි ආයෝජන කල්පිරීම් හා පොලිය රු. 40,467,858 ක් ද, පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල් දායක ලැබීම් රු.125,560,435 ක්ද, සියයට 06 ක් වූ ගුරු විශ්‍රාම වැටුප් අරමුදල් දායකය රු.13,355,549 ක් ද සියයට 25 ක් වූ ද්විතික පදනම මත මුදාහරින ලද නිලධාරින්ගේ දායකය රු.12,332,336 ක්ද, ශ්‍රවණාගාර කුලී රු.33,000 ක් ද නොගෙවූ විශ්‍රාම වැටුප් ආපසු ලැබීම් යනාදි වශයෙන් වූ ආදායම් මූලාශ්‍ර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වාර්ෂික අග්‍රිම සැලැස්ම හා අග්‍රිම සීමාව සකස් කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවට අග්‍රිම ලැබීම් හැර අනෙකුත් ආදායම් ලෙස රු.මිලියන 27,643 ක් ලැබී තිබුණි. ආදායම් වර්ග අනුව මාසික ලැබීම්වල විශ්ලේෂණයක් සකස් කර නොතිබුණි.

(ඇ) මාසික අග්‍රිම ඉල්ලීමේදී 2015 දෙසැම්බර් 14 දිනැති අංක 08/2015 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව TOD/Imp/4 ආකෘති පත්‍රය මගින් එක් එක් මාසයේ පුනරාවර්තන හා මූලධන වියදම් අවශ්‍යතාවය සඳහන් කර අග්‍රිම ඉල්ලුම් කර නොතිබුණි.

(ඇ) අග්‍රිම සැලැස්ම නිසි පරිදි සකස් කර, සියළු බැංකු ගිණුම්වල පවත්නා අතිරික්ත මුදල් නිසි පරිදි නිල බැංකු ගිණුම මගින් අනාවරණය කර, ඒ අනුව පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා අග්‍රිම ඉල්ලුම් කර නොතිබුණි. මේ නිසා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළ මුදල් නිෂ්කාර්යව රැඳී පැවතුණු බව නිරීක්ෂණය වූ අවස්ථා පහත දක්වා ඇත. එහෙයින්

භාණ්ඩාගාරයට පවා නිසි ලෙස මූල්‍ය කළමණාකරණයක් පවත්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව සහය වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුමේ මුදල් පොත අනුව එක් එක් මාසය අවසානයේදී රු.මිලියන 89.25 ක අවම මුදල් ශේෂයක සිට රු.මිලියන 662.24 ක උපරිම මුදල් ශේෂයක් දක්වා වූ පරාසයක මුදල් ශේෂ නිෂ්කාර්යව රැඳී පැවතුණි.

(ii) විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා භාවිතා කරන අනෙකුත් බැංකු ගිණුම්වල එක් එක් මාසය අවසානයේදී වූ ශේෂය රු.307,605 ක සිට රු. 121,874,202 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් මුදල් ශේෂ නිෂ්ක්‍රියව පැවැතුණි.

(iii) වැන්දඹු හා අනත්දරු දායක මුදල් රැස් කරන, මුදල් පොත අනුව ඒ ඒ මාසය තුළ අග්‍රිම ඉල්ලුම් කරන දින වන විට පැවැති තත්ත්වය අනුව අවමය රු.මිලියන 12.88 ක ශේෂයක සිට රු.මිලියන 140.20 ක් දක්වා පරාසයක මුදල් ශේෂ පැවතිණි.

(iv) පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුමට එකතුවන දායක මුදල් සෑම මාසයකම අවසානයේ දී පමණක් දෙපාර්තමේන්තුවේ පොදු ගිණුමට මාරු කරන බැවින්, එම සෑම මාසයකම පළමු සති දෙක තුළදී එකතු වූ රු.මිලියන 1.51ක සිට රු.මිලියන 11.82 ක් දක්වා වූ පරාසයක මුදල් ශේෂ නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි.

(v) ඉහත කරුණු අනුව, අතැති සියලු මුදල් ශේෂයන් අනාවරණය කර අග්‍රිම ලබා නොගැනීම හේතුවෙන් දෙපාර්තමේන්තුව තුළ අතිරික්ත මුදලක් නිරතුරුවම පවතින බව අනාවරණය විය. එමෙන්ම 2016 දෙසැම්බර් මාසයේදී විශ්‍රාම වැටුප් ගෙවිය යුතු නියමිත දිනට අමතරව විශ්‍රාමිකයින් 241 දෙනෙකු සඳහා රු.මිලියන 191.60 ක භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබා ගැනීමකින් තොරව ගෙවීම් කර තිබුණි.

(ඉ) 2016 වර්ෂයේදී විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත රු.මිලියන 3,848 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව එම වියදම රු.මිලියන 4,031 ක් වී තිබුණි. ඒ අනුව රු.මිලියන 183 ක් ප්‍රතිපාදන ඉක්මවා වැය කර තිබුණත්, එම වෙනසට හේතු අනාවරණය කර නොතිබුණි.

**3.7 ආදායම් ගිණුම්**

----------------

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ආදායම් සංකේත 02 ක් සඳහා ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරය පැවැරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) 20.04.01.00 දරන ආදායම් සංකේතය - සමාජ සංරක්ෂණ දායක මුදල් (මධ්‍යම රජය )**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හැර මධ්‍යම රජයට අයත් අනෙකුත් ආයතනයන්ගෙන් සමාලෝචිත වර්ෂයේදී මාසිකව ලැබුණු සමාජ සංරක්ෂණ දායක මුදල්වල එකතුව රු.මිලියන 11,757.82 ක් විය. එම ලැබීම්වල මාසික විචලනය රු.82,640,212ක් වූ සෘණ අගයක සිට රු.160,521,197ක් වූ ධන අගයක් දක්වා වූ පරාසයක පැවතුණි. මෙම විචලනයට හේතු සංඛ්‍යාත්මකව විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ii) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ මාසික සමාජ සංරක්ෂක දායක මුදල් ලැබීම් රු.මිලියන 6.74 ක සිට රු.මිලියන 32.10 ක් දක්වා පරාසයක අගයක් ගෙන තිබුණි. නිලධාරින්ගේ මාසික දායක මුදල් ලැබීම් සහ විශ්‍රාම යන අවස්ථාවේදී සමුච්චිතයක් වශයෙන් හෝ වෙන යම් ආකාරයක අයකරනු ලබන දායක මුදල් අයකිරීම් පිළිබඳ උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව සෑම මාසයකම ගිණුම් සාරාංශ මඟින් හර හා බැර කරන ලද දායක මුදල් පිළිබඳ වාර්තාවන් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම එවිය යුතු වුවද අදාල ආයතන එම වාර්තා එවා නොතිබුණි. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ද එම වාර්තා මාසිකව ගෙන්වා ගැනීමට විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී රු.3,546,645ක් ආදායමෙන් ආපසු ගෙවා තිබූ අතර එම ගෙවීම්වලින් රු.2,792,786 ක් තහවුරු කර ගැනීම සඳහා 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව අදාළ ආයතන වලින් හර නිවේදන ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(v) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අදාළව 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වැටුප් රහිත නිවාඩු ලබා සිටි නිලධාරින් 36 දෙනෙකුගෙන් එම කාලයට අදාළ දායක මුදල් අය කර ගෙන නොතිබුණි.

(vi) සමාජ සංරක්ෂණ ක්‍රමය යටතේ ලියාපදිංචි වූ රාජ්‍ය නිලධාරින් පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(vii) මධ්‍යම රජය හා පළාත් සභාවල නියුතු ද්විතියික පදනම මත මුදාහරින ලද නිලධාරින්ගේ දායක මුදල් ලැබීම් පිළිබඳ ලේඛන පවත්වා නොතිබුනෙන් ඊට අදාල හිඟයන් පිළිබඳවද තොරතුරු අනාවරණය කර ගත නොහැකි වී තිබුණි.

(viii) ආදායම් සංකේත 20:04:01:00 (මධ්‍යම රජය) හා ආදායම් සංකේත 20:04:02:00 (පළාත් සභා) යන වෙන් වූ ආදායම් ශීර්ෂ සඳහා වෙන් වෙන්ව පොත්පත් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ix) වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හා දායක මුදල් ආපසු ගෙවීම් යනාදි ප්‍රතිලාභ හිමිගැන්වීමේදී දායක මුදල් ලැබීම් ඒ ඒ පුද්ගලයාගෙන් නිශ්චිතව අඛණ්ඩව ලැබුනේද යන්න සනාථ කර ගැනීමට නිසි ක්‍රමවේදයක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

**(ආ) 20.04.02.00 දරන ආදායම් සංකේතය - සමාජ සංරක්ෂණ දායක මුදල් පළාත් සභා**

**--------------------------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාජ සංරක්ෂණ ක්‍රමය යටතේ ලියාපදිංචි වූ රාජ්‍ය නිලධාරින් පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ii) වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හා දායක මුදල් ආපසු ගෙවීම් යනාදි ප්‍රතිලාභ හිමිගැන්වීමේදී දායක මුදල් ලැබීම් ඒ ඒ පුද්ගලයාගෙන් නිශ්චිතව අඛණ්ඩව ලැබුණේද යන්න සනාථ කර ගැනීමට නිසි ක්‍රමවේදයක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

(iii) 2001 ජනවාරි 15 දිනැති අංක 01/2001 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.1 හා 2.2 වගන්ති ප්‍රකාරව පිළිවෙළින් එළඹෙන මාසයේ 05 වැනි දිනට හා 20 වැනි දිනට පෙර ආයතනික හා පළාත් සභා මට්ටමින් දායක චෙක්පත් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) පළාත් සභාවලින් සමාජ සංරක්ෂණ දායක මුදල් ලෙස දෙපාර්තමේන්තුවට ලැබෙන මුදල මාසිකව විවිධ අගයන් ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට සමාජ සංරක්ෂණ දායක මුදල රු.මිලියන 6,089.79 ක් වී තිබුණි. එම ලැබීම්වල මාසික විචලනය රු.මිලියන 411.84 ක් වූ ඍණ අගයක සිට රු.මිලියන 358.85 ක් වූ ධන අගයක් දක්වා වූ පරාසයක පැවතුණි. මෙම විචලනයන්ට හේතු සංඛ්‍යාත්මකව ඉදිරිපත් කර නොතිබුණි.

(v) ආදායම් සංකේතය යටතේ මධ්‍යම හා බස්නාහිර පළාත් සභාවල එක් එක් ආයතනික මට්ටමින්ද, අනෙකුත් පළාත් සභා ආයතනයන්ගේ එකතුවක් ලෙසද සාමාන්‍යයෙන් මාසිකව චෙක්පත් 600 ක් පමණ ලැබී තිබුණි. ආයතනික මට්ටමින් ශීර්ෂ අනුව ආදායම් සංකේතයට බැර කර තිබුණු ආදායම් පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කරමින්, සෑම මාසකයදීම අදාළ ආයතනවලින් නියමිත දායක මුදල නිවැරදිව අදාළ දිනයට ලැබුණේද යන්නත්, හිඟයක් පවතීද, යන්නත් තහවුරු කර ගැනීමට හැකි වන පරිදි සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී රැස් කරන ලද රු.මිලියන 6,089.64 ක් වූ ආදායම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.

(vi) රජයේ සේවයේ නියුතු ද්විතියික පදනම මත මුදාහරින ලද නිලධාරින්ගේ දායක මුදල් ලැබීම් පිළිබඳ ලේඛන පවත්වා නොතිබුණු බැවින් ඊට අදාළ හිඟ හිටි දායක මුදල් පිළිබඳව තොරතුරු අනාවරණය කර ගැනිමට නොහැකි වී තිබුණි.

(vii) සමාලෝචිත වර්ෂයේදී ආදායම් ලෙස ලැබී තිබුණු නමුත් එකතුව රු.990,311 ක් වටිනා චෙක්පත් විකෘති වීම හා කල් ඉකුත් වීම නිසා ගිණුම් තැබීමෙන් තොරව අදාළ ආයතන වෙත ආපසු හරවා යවා තිබුණි. එසේ ආපසු යවා තිබුණු රු.990,311 ක් වූ චෙක්පත් පිළිබඳව පසුවිපරම් කළ හැකි පරිදි චෙක්පත් ආපසු හරවා යැවීමේ ලේඛනය යාවත්කාලීනව කර නොතිබුණි. එම ආදායම් හිඟ ආදායම් ලෙස පෙන්වීමටද කටයුතු කර නොතිබුණි.

(viii) ආදායම් ගිණුම අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 528.56 ක හිඟ ආදායම් පැවතුණි. පළාත් සභාවලින් වාර්තා කර තිබුණු වටිනාකම් පමණක් හිඟ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි. එමෙන්ම මධ්‍යම හා බස්නාහිර පළාත් සභාවල, පළාත් පාලන ආයතනයන්ගේ හිඟ ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. දායක මුදල් ලැබීම් නිසි පරිදි සටහන් කර ලේඛනයක් පවත්වා නොතිබීම නිසා හිඟ ආදායම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ix) පළාත් සභා 05කින් ලබා ගත් තොරතුරු අනුව, පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශනවල 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වැන්දඹු හා අනත්දරු දායකය ලෙස වාර්තා කර තිබූ අගය හා ආදායම් ගිණුමේ එම පළාත් සභා යටතේ වාර්තා කර තිබූ හිඟය අතර රු.මිලියන 96.87 ක වෙනසක් පැවතුණි.

(x) ලැබිය යුතු හා ලද දායක මුදල් පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු පවත්වා නොතිබුණු නිසා හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට හා ඒ සඳහා අවශ්‍ය විධිවිධාන සකස් කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(xi) සිවිල් රාජ්‍ය නිලධාරින්ගෙන් සමාජ සංරක්ෂණ දායක මුදල් රැස් කිරීමේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් ලියාපදිංචි අංකයක් නිකුත් කර තිබුණද, සන්නද්ධ අංශවල නිලධාරින්ගෙන් සමාජ සංරක්ෂණ දායක මුදල් රැස් කිරීමේදී එවැනි ලියාපදිංචි අංකයක් නිකුත් කර නොතිබුණි. මේ නිසා නිලධාරීන්ට එකම තත්ත්වයේ විශ්‍රාමික ප්‍රතිලාභ හිමිගැන්වීමේ දී ආකාර දෙකකට කටයුතු කර තිබුණි.

(xii) ආදායම් සංකේත 20:04:01:00 (මධ්‍යම රජය) හා ආදායම් සංකේත 20:04:02:00 (පළාත් සභා) යන වෙන් වූ ආදායම් ශීර්ෂ සඳහා වෙන් වෙන්ව පොත්පත් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) හිඟ කුලී ආදායම්**

**------------------**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පරිශ්‍රය තුළ පවතින අතිරික්ත ඉඩකඩ ආයතන 14 කට ලබාදිම තුළින් 2016 දෙසැම්බර් 31 දිනට බදු කුලි ලෙස රජයේ ආදායමට එකතු විය යුතු රු.මිලියන 75.38 ක් හිඟහිටව පැවතුණි. ඉන් රු.මිලියන 36.58 ක හිඟහිටි ආදායමක් ලැබිය යුතුව තිබුණු ආයතන 05 ක් වර්තමානයේදී පරිශ්‍රයෙන් ඉවත්ව ගොස් තිබුණි. එම හිඟ හිටි ආදායම් අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයේ පැවතුණි.

**3.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-----------------------------------------------------------------------

විෂය අංක 25301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට ස්ථාන මාරු වී ගිය හා සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතුව තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 1.32 ක් වී තිබුණි. එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 25 ක් දක්වා වූ කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට පැවත එමින් තිබුණු රු.4,796 ක ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) කේවල ශේෂ වර්ගීකරණයේ සාරාංශ ශේෂය සහ පාලන ගිණුමේ ශේෂය අතර ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙන එමින් තිබුණු රු.52,217 ක වෙනස සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

**3.9 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

-------------------------------------

**අභ්‍යන්තර විගණනය**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී නිකුත් කර තිබුණු අභ්‍යන්තර විගණන විමසුම් 29 කින් 20 ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්මෙහි ඇතුළත් කර තිබුණු විගණන ක්ෂේත්‍ර 07 ක් කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

**3.10 වත්කම් කළමනාකරණය**

-------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සෑම වර්ෂයකම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් කාල ප්‍රමාදයකින් පසුව 2017 ජුනි 23 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි.

(ii) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පරිශ්‍රය, කැළණිය වෙදමුල්ල නිවාඩු නිකේතනය හා රම්බොඩ නිවාඩු නිකේතනය සම්බන්ධයෙන් 2017 ජුනි 23 දින ඉදිරිපත් කර තිබුණු 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සඳහන් භෞතිකව හඳුනාගත්

ශේෂ හා ස්ථාවර වත්කම් ලේඛණය අනුව වූ ශේෂ අතර භාණ්ඩ වර්ග 09කට අදාළ අයිතම් 282 ක ඌනතා හා අතිරික්තයන් අනාවරණ වී තිබුණත්, එම ශේෂ පිළිබඳව සැසඳීම් කර නොතිබුණි.

(iii) 2016 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව කැළණිය වෙදමුල්ල නිවාඩු නිකේතනයේ භාණ්ඩ වර්ග 17 ක අයිතම් 251 ක ඌනතාවයක් අනාවරණය වී තිබුණි. ඒ සඳහා මුදල් රෙගුලාසි 757(2) (අ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iv) පොදු 47 වාර්තාවට අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ, කැළණිය වෙදමුල්ල නිවාඩු නිකේතනයේ සහ රම්බොඩ නිවාඩු නිකේතනයේ පිළිවෙලින් ප්‍රයෝජනයට ගත නොහැකි හා විනාශ කර දැමිය යුතු භාණ්ඩ (D) 51, 336 හා 39 ක්ද , ප්‍රතිසංස්කරණය කළ යුතු භාණ්ඩ (R) 09, 07 හා 04 ක්ද විය. එසේම දෙපාර්තමේන්තු පරිශ්‍රයේ හා කැළණිය වෙදමුල්ල නිවාඩු නිකේතනයේ ටෙන්ඩර් කැඳවා විකිණිය යුතු භාණ්ඩ පිළිවෙලින් 03ක් හා 1032 ක් හඳුනාගෙන තිබුණත්, ඒ සඳහා 2017 ජුනි 23 දින වන විටත් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3.11 බේරුම් නොකළ බැරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.මිලියන 62,680.91 ක් විය.

(ආ) මුදල් රෙගුලාසි 447 ප්‍රකාරව එළඹ තිබුණු බැරකම් පිළිබඳ විස්තර වැය ලෙජරයේ සටහන් කර නොතිබුණි.

## 3.12 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| 1898 අංක 01 දරන වැන්දඹු හා අනත්දරු ආඥා පනතේ 41 වගන්තිය | 166,963 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප, විශ්‍රාමිකයාගෙන් අයවිය යුතු හිඟ මුදලක් එම විශ්‍රාමිකයා මිය ගිය පසු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපට හිලව් නොකළ යුතුව තිබුණත්, නියැදි විගණන පරීක්ෂාවන් අනුව කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 05 දෙනෙකුගෙන් වැන්දඹු විශ්‍රාම වැටුපෙන් රු.166,963 ක් අයකර ගෙන තිබුණි. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**<br>**-------------------------------------** | | |
| | V වන පරිච්ඡේදයේ 2.5.3 වගන්තිය | - | ද්විතියික පදනම මත රාජ්‍ය සංස්ථාවක සේවය සඳහා මුදා හරින ලද නිලධාරීන්ගෙන් නව ඒකාබද්ධ වැටුපෙන් සියයට 25 ක් වූ දායක මුදල් ලබා ගත යුතුව තිබුණි. එසේ මුදාහරින ලද නිලධාරීන් හඳුනා ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් නොතිබුණු අතර එසේ දායක මුදල් එවනු ලබන නිලධාරීන් පිළිබඳව ලේඛනයක් හෝ පවත්වා නොතිබුණි. |
| **(ඇ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>**-------------------------------------** | | |
| | (i) මුදල් රෙගුලාසි 137, 138 හා 139 | 956,901 | (i) ගෙවීම් අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම යන අවස්ථාවලදී මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රමාණවත් සැලකිල්ලකින් යුතුව කටයුතු නොකිරීම නිසා එකතුව රු.211,375 ක ගෙවිය යුතුව තිබුණු මුදලක් වෙනුවට රු.1,116,640 ක් ගෙවීම නිසා විශ්‍රාමිකයින් 4 දෙනෙකුට එකතුව රු.956,901 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| | | 48,117 | (ii) ප්‍රදාන පත්‍රයේ සඳහන් අඩු කළ විශ්‍රාම වැටුප හා විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියේ සඳහන් මාසික විශ්‍රාම වැටුප අනුව විශ්‍රාමිකයින් දෙදෙනෙකුට පිළිවෙලින් 2014 ජනවාරි මාසයේ සිට 2015 ජූලි මාසය දක්වා රු.16,914 ක්ද, 2013 අගෝස්තු මාසයේ සිට 2016 අගෝස්තු මාසය දක්වා රු.31,203ක්ද, වශයෙන් එකතුව රු.48,117 ක් අඩුවෙන් ගෙවා තිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 138(8) | 105,667 | ගෙවීම් තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු බිල්පත වෙනුවට එහි ඡායා පිටපතක් මත ගෙවීම් සහතික කර අවස්ථා 04 කදී එකතුව රු.105,667 ක් ගෙවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 156(5) | 16,035,063 | නියැදි විගණන පරීක්ෂාවකදී ගෙවීම් වවුචර් 09 ක ටිපෙක්ස් කර, වැරැද්ද රතු පැනෙන් නිවැරදි කර කෙටිසන යෙදීම කෙරෙහි සැලැකිල්ල යොමු නොකර එකතුව රු.මිලියන 16.03 ක් ගෙවා තිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 170(2) | 1,765,000 | 2016 අප්‍රේල් මාසයේ සිට නොවැම්බර් මාසය දක්වා කාලය තුළ පෞද්ගලික ආයතන 19 කින් දෙපාර්තමේන්තුව වෙත රු.9,947,965 ක පරිත්‍යාග මුදලින් ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.1,765,000 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර වැය කර තිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 261(1) | - | අනුක්‍රමික අංක කර ගෙවීම් වවුචර් පිළියෙල කර නොතිබුණි. |
| (vi). | මුදල් රෙගුලාසි 262(2) | 427,873 | මුදල් රෙගුලාසි ප්‍රකාරව වවුචර් මත “ගෙවන ලදී මුද්‍රාව” රහිත ගෙවීම් වවුචර් 12 කින් ගෙවීම් කර තිබුණි. |
| (vii) | මුදල් රෙගුලාසි 262(2) හා 237 | 25,401,110 | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් තහවුරු කරන ලියවිලි වවුචරයේ අමුණා නොමැතිව ගෙවීම් වවුචර් 08 කින් ගෙවීම් කර තිබුණි. |
| (viii) | මුදල් රෙගුලාසි 271 (3) | - | නිල බැංකු ගිණුම යටතේ මුදල් පොත් දෙකක් මගින් ගෙවීම් වවුචර් පිළියෙල කර හිඟ විශ්‍රාම වැටුප් ලෙස රු.මිලියන 564.89 ක්ද, සංශෝධිත පාරිතෝෂික ලෙස රු.මිලියන 1,118.00 ක්ද වශයෙන් ගෙවීම් කර තිබුණත්, එම ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ix) | මුදල් රෙගුලාසි 396 (ඇ) | 174,923 | නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොවූ මාස 6 ක කාලය ඉකුත් වූ චෙක්පත් 15 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (x) | මුදල් රෙගුලාසි 880 සහ 881 | | විශ්‍රාම වැටුප් ගෙවීම් හා සම්බන්ධව කටයුතු කරන දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබා ගෙන නොතිබුණි. |
| **(ඇ)** | **විශ්‍රාම වැටුප් චක්‍රලේඛ** | | |
| (i) | 2015 නොවැම්බර් 06 දිනැති අංක 07/2015 දරන චක්‍රලේඛ ලිපියේ 10 ඡේදය | - | කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2016 ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා කාල පරිච්ඡේදයට අදාළ විශ්‍රාම වැටුප් විෂමතා ගැලපීම් සිදු කළ ලිපිගොනු 102 ක් පැවැතුණි. එම ගෙවීම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගණකාධිකාරී විසින් සහතික කර නොතිබුණි. |
| (ii) | 2013 දෙසැම්බර් 03 දිනැති අංක 06/2013 දරන චක්‍රලේඛය හා 2011 ජුනි 14 දිනැති ලිපි අංක 02 | 979,946 | (i) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා විශ්‍රාමිකයින් 15 දෙනෙකු වෙත නොගෙවූ එකතුව රු.979,946 ක් වූ විශ්‍රාම වැටුප්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |
| | | 9,657,084 | (ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් විසින් එකතුව රු.9,657,084 ක නොගෙවූ විශ්‍රාම වැටුප් මාස 11 ක සිට මාස 26 ක් දක්වා කාලයක් පොදු තැන්පත් ගිණුම්වල රඳවා ගෙන කාල ප්‍රමාදයකින් පසුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. |
| | | 3,201,907 | (iii) 2016 ජුලි මාසයේ සිට 2016 දෙසැම්බර් 05 දින දක්වා විශ්‍රාමිකයින් 55 දෙනෙකුගේ එකතුව රු.3,201,907 ක් වූ නොගෙවූ විශ්‍රාම වැටුප් කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණත්, එම මුදල කඩිනමින් |

ගෙන්වා ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

**3.13 කාර්යසාධනය**

**---------------**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

**------------------------------------------------**

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතර පහත දැක්වෙන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) ප්‍රථම වරට ආබාධිත බව සනාථ කර ගැනීම හා වර්ෂ 05කට වරක් ආබාධිත බව සනාථ කර ගැනීම යන අවස්ථා වෙනුවෙන් වෛද්‍ය නිර්දේශය ලබා ගැනීමට 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ අයදුම්පත්‍ර 21 ක් හා සමාලෝචිත වර්ෂයේදී අයදුම්පත් 198 ක් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි. 2017 සැප්තැම්බර් මාසය අවසන් වන විටත් එම ඉල්ලුම්පත් වෙනුවෙන් වෛද්‍ය නිර්දේශ ලබා ගෙන නොතිබුණි.

(ii) විශ්‍රාම වැටුප් අයදුම්පතක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ තැපැල් අංශය වෙත 2015 දෙසැම්බර් 02 දින ලැබී තිබුණි. එදින සිට ලියාපදිංචි අංශය විසින් අනුමැතිය ලබාදෙන දිනය දක්වා දින 164 ක කාලයක් ගත කර තිබුණි. සංශෝධිත ප්‍රදාන පත්‍රය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2016 ජූලි 07 දින යොමුකර තිබුණු අතර, එදින සිට දින 155 ක් ප්‍රමාද වීමෙන් ද හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම සිදු වී තිබුණි.

(iii) 2016 වර්ෂයේදී විශේෂ වන්දි හා වන්දි විශ්‍රාම වැටුප් ගෙවීමට ආදාළව විවිධ රාජ්‍ය ආයතන විසින් දෙපාර්තමේන්තුව වෙත පිළිවෙළින් ලිපිගොනු 25 ක් හා 12 ක් ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට පිළිවෙළින් ලිපිගොනු 10 ක් හා ලිපිගොනු 03 ක් සඳහා පමණක් ගෙවීම් කර තිබුණි.

(iv) විශ්‍රාම වැටුප් සංශෝධනයන්ට අදාළ හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රම ප්‍රතිව්‍යුහගත කිරීමේදී තැපැල් හා ලියාපදිංචි අංශය සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් හා ප්‍රමාණවත් කාර්යාල ඉඩකඩ පිළිබඳව පූර්ව අවධානය යොමු කර නොතිබුණි. ඒ හේතුවෙන් ප්‍රතිලාභ හිමිගැන්වීම අපේක්ෂිත පරිදි සිදු කර නොතිබුණි.

**(ආ) සැලැසුම් කිරීම**

**-----------------**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පිළිවෙළින් ක්‍රියාකාරි සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. එම සැලැසුම්වලට අනුකූලව කටයුතු නොකළ අවස්ථා පහත දැක්වේ.

(i) සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්මේ දක්වා තිබුණු ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා වැය විෂයයන් 09 ක් සඳහා රු.6,703,403 ක් වැය කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණු කාර්යයන් 10 ක් සඳහා රු. 6,080,077 ක් වැය කර තිබුණි.

(iii) 2016 වර්ෂයේදී මූලධන කාර්යයන් 11 ක් ඉටු කිරීමට රු.මිලියන 11.70 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණි.

**(ඇ) විශ්‍රාමික ප්‍රතිලාභ හිමිගැන්වීමේ කාර්යසාධනය ඇගැයිය නොහැකි වීම**

**----------------------------------------------------------------------------**

දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික ප්‍රතිලාභ හිමිගැන්වීම සිදු කරන ලියාපදිංචි, ගණන් බැලීම්, විදේශ විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු යන අංශ වෙත කාර්යසාධනය ඇගැයිය හැකි ආකෘති පත්‍රයක් අනුව තොරතුරු කැඳවා තිබුණද, ඉන් අංශ 2කින් අසම්පූර්ණ ලෙස තොරතුරු ඉදිරිපත් කර තිබුණි. අනෙක් අංශ 2 ක විසින් කිසිදු තොරතුරක් 2017 සැප්තැම්බර් 15 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. මේ නිසා එම අංශවල කාර්යසාධනය පිළිබඳව පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**3.14 පාඩු හා හානි**

**--------------**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන විමසුම් 12ක් යටතේ ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු කාලච්ඡේදයට අදාළ රු.මිලියන 128.88 ක්ද, ප්‍රතිව්‍යුහගතකරණයට පෙර කාලච්ඡේදයට අදාළව රු.මිලියන 40.72 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 169.60 ක් විශ්‍රාමිකයින් 2,213 ක් වෙත වැඩිපුර ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම වැඩිපුර ගෙවීම් අයකර ගැනීම කාර්යක්ෂමව සිදු කර නොතිබුණි.

(ආ) විසර්ජන ගිණුමේ DGSA - 7 ආකෘතියෙහි 2016 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම්වල එකතුව රු.මිලියන 320.26 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එසේ අයකර නොගත් වර්ෂ 5 කට අඩු කාලයක සිට පැවැත එන රු.මිලියන 261.99 ක්ද, වර්ෂ 5 ක සිට වර්ෂ 10 ක් දක්වා පරාසයක කාලයක සිට පැවැත එන රු.මිලියන 48.98 ක් හා වර්ෂ 10 කට වැඩි කාලයක සිට පැවැත එන රු.මිලියන 9.28 ක වැඩිපුර ගෙවීම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 සහ 104 පරිදි කටයුතු කර අදාළ වාර්තා 2017 සැප්තැම්බර් 19 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේම විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණු විශ්‍රාමිකයන්ගෙන් නැවත අයකර ගත් බව සනාථ කිරීමට හැකි වන පරිදි එක් එක් විශ්‍රාමිකයා වෙනුවෙන් ලිපිගොනු පවත්වා නොතිබුණි.

(ඇ) 2013, 2014, 2015 හා 2016 වර්ෂයන්හි සිදු වී තිබූ වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එමෙන්ම අදාළ අනතුරු පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.15** **අනාර්ථික ගනුදෙනු**

---------------------

සමාලෝචිත වර්ෂයේදී රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය විසින් ගෙවිය යුතු රු.342,224 ක වරිපනම් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි.

**3.16** **විසඳා නොතිබුණු විගණන ඡේද**

---------------------------------

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් වැඩිපුර ගෙවීම් හා මෙහෙයුම් අකාර්යක්ෂමතා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| **විගණකාධිපති වාර්තාවට යොමුව** | | **යොමුගත විෂයය** |
|---|---|---|
| **ඡේද අංකය** | **වර්ෂය** | |
| 3.2(අ) | 2015 | ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී මියගිය හා ආබාධිත වූ රණවිරුවන් සඳහා අවුරුදු 55 ක් දක්වා වැටුප් හා දීමනා ගෙවීම සඳහා සන්නද්ධ අංශයන් හා පොලිසිය වෙත රු.මිලියන 26,679 ක් ලබා දී තිබීම හා ඒ සඳහා ප්‍රමාණවත් වූ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| 3.14(අ) | 2015 | ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවන්ට ගෙවනු ලැබූ විශ්‍රාම පාරිතෝෂිකයෙන් සියයට 60 ක් වූ කොටස වසර 10 ක් තුළ නැවත අයකර ගෙන නොතිබුණි. |
| 3.16(ආ) | 2015 | විශ්‍රාම පාරිතෝෂිකයෙන් රජයට අයවිය යුතු අවකරණ අඩු නොකර මුළු පාරිතෝෂිකයම විශ්‍රාමිකයාට ගෙවීම හේතුවෙන් නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි විශ්‍රාමිකයින් 182 දෙනෙකු සඳහා රු.9,956,314 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| 2.7(අ) | 2013 | ඉ-විශ්‍රාම වැටුප් ව්‍යාපෘතිය සඳහා වැටුප් හා වේතන, පුහුණු වීම් හැර අනෙකුත් වියදම් සඳහා රු. මිලියන 182.22 ක් වැය කර තිබුණද, 2013 නොවැම්බර් 01 දින සිට එම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නවතා තිබුණි. |
| 1.6 (අ) I | 2013 | පිරිවෙන් හා උපකෘත පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප වෙනුවෙන් මූලික වැටුපෙන් සියයට 6 ක් ලෙස ලැබෙන දායක මුදල් ගුරු විශ්‍රාම වැටුප් අරමුදලකට බැර කර නොතිබුණි. |
| 3.5.2(ඇ) | 2015 | 2016 වර්ෂයේදී විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ අග්‍රිමය විදේශ කටයුතු අමාත්‍යාංශය හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අතර රු.මිලියන 4 ක වෙනසට හේතු අනාවරණය කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| 3.9.3(අ) | 2015 | 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(I) හා 2016 ජනවාරි 28 දිනැති DMA/2009(I)(i) දරන චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. |
| 3.9.1(ඇ) | 2015 | විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම්හි කාර්ය සාධනය ඇගැයිය හැකි පරිදි කාර්යසාධන දර්ශක පිහිටුවා, කාර්යසාධනය ඇගැයීමට කටයුතු කර නොතිබුණි. |
| 1.5(අ)(iii) | 2013 | දෙපාර්තමේන්තු වාහන සඳහා ඉන්ධන මිලදී ගැනීමේදී ඉන්ධන ඇණවුම් පොත් භාවිතා කර නොතිබුණි. |

## 3.17 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ) නොගෙවා ආපසු ලැබූ විශ්‍රාම වැටුප් අධීක්ෂණය නොකිරීම.**

චෙක්පත් මඟින් නිල බැංකු ගිණුමට ලැබෙන, ගෙවන ලද විශ්‍රාම වැටුප් ආපසු ලැබීම් පිළිබඳව හා නිල බැංකු ගිණුමට සෘජුවම ලැබෙන නොගෙවූ විශ්‍රාම වැටුප් පිළිබඳව අධීක්ෂණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ආ) වාර්ෂික ජීවිත සහතික ඉදිරිපත් නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විශ්‍රාම වැටුප් මධ්‍යගත දත්ත පද්ධතිය අනුව ලබාගත් තොරතුරු අනුව 2016 වර්ෂය සඳහා විශ්‍රාමිකයින් 109,842 දෙනෙකු ජීවිත සහතික ඉදිරිපත් කර නොතිබුණි. එය මුළු විශ්‍රාමිකයින් සංඛ්‍යාවෙන් සියයට 19ක් විය. විශ්‍රාම වැටුප් ගෙවීමේදී වාර්ෂික ජීවිත සහතිකය වර්ෂය ආරම්භයේදී ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) වාර්ෂිකව ලබාගන්නා ජීවිත සහතික අදාළ විශ්‍රාමික ලිපිගොනු තුළ ගොනු ගත නොකිරීමෙන් විශ්‍රාමික දත්ත පද්ධතිය අනුව විශ්‍රාමිකයා හා විශ්‍රාමික ගොනුව අතර යාවත්කාලීන වීම් තහවුරු කර ගැනීමට නොහැකි විය.

**(ඇ) බාලවයස්කරුවන්ගේ වයස සම්පූර්ණ වුවද, පාස් පොත් ඔවුන් වෙත ලබා නොදීම.**

විශ්‍රාම ප්‍රතිලාභ හිමිගැන්වීම් ක්‍රම යටතේ බාලවයස්කරුවන්ට හිමිවන මුදල්, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු ගිණුමක හෝ ස්ථාවර තැන්පතුවක තැන්පත් කර නිසි වයස සම්පූර්ණ වූ විට බාලවයස්කරුවන්ට ලබාදීමේ වගකීම අදාළ රාජ්‍ය ආයතන වෙත පවරා තිබුණි. පසුව එම ක්‍රියාදාමය නිවැරදිව සිදුවන්නේද යන්න පිළිබඳව අධීක්ෂණය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත පවරා විශ්‍රාම වැටුප් චක්‍රලේඛයක් නිකුත් කර තිබුණි. ඒ පිළිබඳව පරීක්ෂාවේදී නිසි වයස සම්පූර්ණ වූ බාලවයස්කරුවන්ට හිමි ප්‍රතිලාභ හිමිගන්වා නොතිබූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) කොළොන්නාව හා කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බාලවයස්කරුවන්ගේ වයස සම්පූර්ණ වී තිබුණද, ඔවුන් වෙත ලබා නොදුන් ඉතිරිකිරීම් ගිණුම් පොත් 41 ක් හා ස්ථාවර තැන්පතු 5 ක්ද පැවතිණි.

(ii) දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව, 1927 වර්ෂයේ සිට 1995 වර්ෂය දක්වා කාලය තුළදී බාලවයස්කරුවන් 1482 ක් වෙනුවෙන් තැන්පත් කරන ලද රු.1,549,848 ක් 2013 අගෝස්තු 30 දින වන විටද බාලවයස්කාරිත්වය සම්පූර්ණ කර තිබුණු ප්‍රතිලාභීන් වෙත අදාළ ඉතිරිකිරීම් ගිණුම් පොත් ලබා දී නොතිබුණි. 1995 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලය තුළදී බාලවයස්කරුවන් 943 දෙනෙකුගේ වයස සම්පූර්ණ වුවද, ඔවුන් සඳහාද ඉතිරි කිරීම් ගිණුම් පොත් ලබා දී නොතිබුණි. මේ අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් බාලවයස්කරුවන්ගේ ඉතිරිකිරීම් ගිණුම් පොත්වල තැන්පත් කරන ලද මුදලින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

(iii) පාස්පොත් ලබා දීමේ පැරණි ක්‍රමවේදයේ පැවති දුර්වලතා හේතුවෙන් 2015 සැප්තැම්බර් 14 දිනැති අංක 09/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මඟින් බාලවයස්කරුවන්ට ප්‍රතිලාභ හිමිගන්වන මුල් අවස්ථාවේදීම පාස්පොත භාරකරුවා අතට පත් කර තිබුණි. කෙසේ නමුත් පැරණි ක්‍රමවේදය යටතේ පැවති පාස්පොත් සහ ස්ථාවර තැන්පතුවල ප්‍රතිලාභ හිමිකරුවන් වෙත ලබාදීමට විධිමත් වැඩපිළිවෙලක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ස්ථාපිත කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඈ) විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණු විශ්‍රාමිකයන්ගේ තොරතුවල නිවැරදිතාවය තහවුරු කර නොතිබීම**

-------------------------------------------------------------------------------------------

මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේදී විශ්‍රාමිකයින්ගේ නිවැරදි තොරතුරු විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියට ඇතුළත් කර එහි නිවැරදිතාවය සහතික නොකිරීම නිසා විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප බැංකු ගිණුමට බැර නොවී ප්‍රතික්ෂේප වූ අවස්ථා හා විශ්‍රාමිකයා මිය ගියද විශ්‍රාම වැටුප බැංකු ගත කළ අවස්ථා නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

(i) 2016 අගෝස්තු සහ සැප්තැම්බර් යන මාසයන්හි විශ්‍රාම වැටුප් ගෙවීමේදී විශ්‍රාමිකයාගේ බැංකුව අයත් බැංකු සංකේතය නිවැරදිව විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියට ඇතුළත් නොකිරීම නිසා විශ්‍රාමිකයින් 04 දෙනෙකුගේ රු. 325,776 ක් වූ විශ්‍රාම වැටුප් නොගෙවා ප්‍රතික්ෂේප වී තිබුණි.

(ii) අවස්ථා 6 කදී එකතුව රු.මිලියන 1.27 ක් වූ විශ්‍රාම වැටුප් ප්‍රතික්ෂේප වීම් අනාවරණය වී තිබුණි. ඊට හේතු අනාවරණය කර නොගැනීම නිසා, එම මුදල් අඛණ්ඩව මාස 03 ක සිට මාස 10 ක් දක්වා කාලයක් බැංකු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(iii) 2016 සැප්තැම්බර් මාසයේ විශ්‍රාම වැටුප් වැටුප් ගෙවීමේදී විශ්‍රාමිකයාට අයත් නොවන බැංකු ගිණුමකට රු. 217,680 ක් ගෙවීම හේතුවෙන් විශ්‍රාම වැටුප ප්‍රතික්ෂේප වී තිබුණි.

(iv) 2014 ජනවාරි 10 දින මියගිය විශ්‍රාමිකයකුගේ විශ්‍රාම වැටුප ඔහු මිය ගිය පළමු මාසයේ සිට ගෙවීම බැංකුව විසින් ප්‍රතික්ෂේප කර දෙපාර්තමේන්තුව වෙත එම මුදල ආපසු එවා තිබුණත්, ඒ පිළිබඳ අවධානය යොමු නොකර අඛණ්ඩව මාස 22 ක් අදාළ විශ්‍රාම වැටුප ගෙවීම සඳහා බැංකුගත කර තිබුණි.

(v) බැංකුව මඟින්, විශ්‍රාමිකයින් පස් දෙනෙකුගේ බැංකු ගිණුම වසා ඇති බව පළමු මාසයේ සිටම දන්වා තිබියදී මාස 11 ක සිට මාස 22 දක්වා කාලයක් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම වැටුප අඛණ්ඩව බැංකු ගත කර තිබුණි.

(ඉ) 2006 අප්‍රේල් 25 දිනැති අංක 6/2006 දරන චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව යටතේ ආබාධිත විශ්‍රාම වැටුප් ලබන්නන් සඳහා 2016 ඔක්තෝබර් 14 දින වන විටත් අදාළ විශ්‍රාම වැටුප් ගැලපීම් කර නොතිබුණි.

(ඊ) නොගෙවූ විශ්‍රාම වැටුප් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා බැංකු මඟින් අවස්ථා21 කදී දෙපාර්තමේන්තුවට එවන ලද කාලය ඉකුත් වූ එකතුව රු5.,093, 465ක වටිනා චෙක්පත් 21 ක් කඩිනමින් දින දිර්ඝ කර බැංකුගත කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි . මේ නිසා 2014 , 2015 හා 2016 වර්ෂවලදී ආපසු හරවා යවා තිබුණු චෙක්පත් 2017 පෙබරවාරි මාසය වන විටත් දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණි .

(උ) කාර්තු වාර්තා අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක විශ්‍රාමිකයින් 6 දෙනෙකු සඳහා ගෙවන ලද රු 323,250.ක විශ්‍රාම වැටුප් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි .

(ඌ) ක් 22.85 මිලියන.දෙනෙකුට රු 168 මගත්වර්ෂවලදී විශ්‍රා 2016 හා 2015විශ්‍රාම වැටුප් වශයෙන් වැඩිපුර ගෙවා තිබුණු බව විගණන විමසුම් ධානියා ක් මගින් දෙපාර්තමේන්තු ප්‍ර 06 දෙනෙකුට ගෙවන 102 මිකයන්එසේ වැඩිපුර ගෙවා තිබුණු මුදලින් විශ්‍රා .දැනුවත් කර තිබුණි .ලද එකතුව රුමිලියන ගැනීමට දෙසැම්බර් මාසය වන විටත් අයකර 2016 ක් 11.65 .දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි

(එ) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදුකළ නියැඳි විගණන පරීක්ෂාව අනුව විශ්‍රාමිකයින් මිය යාම දැනුම් දීම පිළිබඳව කඩිනම් හා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි මේ .හේතුවෙන් දැනුම් දීම ප්‍රමාද වීම මත විශ්‍රාම වැටුප් ගෙවූ අවස්ථා 25 ක දී රු .842,770 ක් වැඩිපුර ගෙවා තිබුණි .2014 මාර්තු මාසයේ සිට 2016 සැප්තැම්බර් මාසය අතර කාලයේ සිදු වී තිබූ මෙම වැඩිපුර ගෙවීම් අය කර ගැනීමට වර්ෂ 2 ක කාලයක් ඉක්මවා තිබුණද, 2016 ඔක්තෝබර් 14 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.18 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 22 | 04 | 2 |
| (ii) | තෘතියික මට්ටම | 11 | 05 | 06 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1076 | 911 | 165 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 75 | 65 | 10 | - |
| (v) | වෙනත් (අනියම්) | - | 4 | - | 4 |
| | **එකතුව** | **1,186** | **1007** | **185** | **6** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැවති මුළු පුරප්පාඩු 185 පිරවීමට අපොහොසත් වී තිබුණි.

(ii) උද්‍යාන කම්කරු සඳහා අනුමත සේවක සංඛ්‍යාව 03ක් වූ අතර එම සේවකයින් 2014 ජුනි මාසයේ සිට අනියම් පදනමින් බඳවාගෙන සේවයේ යොදවාගෙන තිබුණි.

(iii) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන්ගේ අනුමත සංඛ්‍යාව 07ක් වුවත් තථ්‍ය සංඛ්‍යාව 09ක් සිටීම නිසා නිලධාරීන් දෙදෙනෙකුගේ අතිරික්තයක් පැවතිනි. ඒ සඳහා විධිමත් අනුමැතියක් අදාළ පාර්ශව වෙතින් ලබාගෙන නොතිබුණි.

**(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් වෙනත් පාර්ශව වෙතින් ලබාගත් මානව සම්පත් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | සේවක වර්ගය | සංඛ්‍යාව | ලබාගත් පාර්ශවය | කාලපරිච්ඡේදය |
|---|---|---|---|---|
| (i) | කාන්තා පොලිස් සැරයන් | 01 | ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව | 2010.06.08 සිට මේ දක්වා |
| (ii) | කාන්තා පොලිස් කොස්තාපල් | 01 | එම | 2012.02.24 සිට මේ දක්වා |
| (iii) | කාන්තා පොලිස් කොස්තාපල් | 03 | එම | 2015 ජුනි 25 දින සිට 2016 දෙසැම්බර් 21 දින සිට එක් නිලධාරිනියක් සේවය සඳහා වාර්තා කර නැත. |